(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **86.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 ජූලි 20 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

# පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **කෙහෙළිය රඹුක්වැල්ල මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** සෞඛ්‍ය අමාත්‍යතුමිය

ගරු **විමල් වීරවංශ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹෑපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. වී. චානක මහතා,** ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගීතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **ටිරාන් අලස් මහතා**

ගරු **නසීර් අහමඩ් මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු සූ. නෝගරාදලිංගම් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු  එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු  මොහමඩ් මුසම්මිල් මහතා

ගරු  අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු  වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු  පාඨලී චම්පික රණවක මහතා

ගරු  නිපුණ රණවක මහතා

ගරු  බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු  (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු  කුමාරසිරි රත්නායක මහතා

ගරු  අලි සබ්රි රහීම් මහතා

ගරු  ඉෂාක් රහුමාන් මහතා

ගරු  මුජිබුර් රහුමාන් මහතා

ගරු  (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු  හර්ෂණ රාජකරුණා මහතා

ගරු  අජිත් රාජපක්ෂ මහතා

ගරු  ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු  (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු  උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු  (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු  එම්. රාමේෂ්වරන් මහතා

ගරු  ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු  වරුණ ලියනගේ මහතා

ගරු  ගාමිණී වලේබොඩ මහතා

ගරු  ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු  රනිල් වික්‍රමසිංහ මහතා

ගරු  රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු  රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු  චමින්ද විජේසිරි මහතා

ගරු  එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු  මධුර විතානගේ මහතා

ගරු  හේෂා විතානගේ මහතා

ගරු  (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු  චන්දිම වීරක්කොඩි මහතා

ගරු  (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු මහින්ද සමරසිංහ මහතා**

**ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු ජෝන් සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු රවුෆ් හකීම් මහතා**

**ගරු අබ්දුල් හලීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා**

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඊයේ දින පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත භාර දෙන ලද විශ්වාස භංග යෝජනාවට සංශෝධනය සම්බන්ධයෙන් මම තීන්දුවක් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් හතළිස් තුන්දෙනෙකු විසින් දැනුම් දෙන ලද විශ්වාස භංග යෝජනාව බලශක්ති අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මහතා සම්බන්ධයෙන් වන අතර යෝජනාව පිළිබඳ දැනුම්දීම 2021 ජූනි මස 22 වැනි දින පාර්ලිමේන්තු ලේකම් කාර්යාලයට භාර දෙන ලදුව 2021 ජූනි 23 වැනි දින පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරන ලදී. විශේෂ පාර්ලිමේන්තු රැස්වීම් දිනයක් ඇතුළුව 2021 ජූලි 19 සහ 2021 ජූලි 20 යන අනුගාමී දින දෙකකදී යෝජනාව විවාදයට ගැනීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව 2021 ජූලි 5 වැනි දින තීරණය කළේය. විශ්වාසභංග පූර්ණ යෝජනාව පිළිබඳ දැනුම්දීමෙහිදී එය අවසානයේ ආණ්ඩුව වන අමාත්‍ය මණ්ඩලය කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් බවට පරිවර්තනය කෙරෙනු ඇති බවට කිසිදු ඇඟවීමක් නොතිබිණි. බලශක්ති අමාත්‍යවරයාට එරෙහි විශ්වාසභංග යෝජනාව ආණ්ඩුවට එරෙහි විශ්වාසභංග යෝජනාවක් බවට පරිවර්තනය කිරීමට සංශෝධනයක් යෝජනා කෙරෙනු ඇති බව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවට ද දැනුම් දෙනු නොලැබිණි. තවද, ඊයේ දිනයේ සභාවේ සිදුවූ විවාදය එක් අමාත්‍යවරයකුට, එනම් ගරු උදය ගම්මන්පිල මහතාට, එරෙහි විශ්වාසභංග යෝජනාව කෙරෙහිම කේන්ද්‍රගත වූවක් විය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වෙත භාර දෙන ලද සංශෝධනයෙහි නෛතික ඵලය වන්නේ බලශක්ති අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මහතාට එරෙහි විශ්වාස භංග යෝජනාව ආණ්ඩුව වන අමාත්‍ය මණ්ඩලය කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් බවට පරිවර්තනය කරමින් එයට නව තත්ත්වයක් අත්කර දීමයි. යෝජනාව පිළිබඳ දැනුම් දීමේ සිට කවර හෝ අදියරකදී මෙය චේතනය නොකෙරිණි.

ස්ථාවර නියෝග 43 (4) හි මෙසේ සඳහන් වේ; 'ප්‍රශ්නයකට ඉදිරිපත් කරනු ලබන සංශෝධනයක්, එම සංශෝධනය යෝජනා කරනු ලබන ප්‍රශ්නයට පමණක් අදාළ විය යුත්තේ ය.'

මෙම මූලධර්මයට අනුව, යෝජිත සංශෝධනය යෝජනාවට අදාළ විය යුතු අතර සභාවෙහි ඉදිරිපත් කරන ලද මුල් යෝජනාවෙහි විෂය පථය තුළ තිබිය යුතුය. කවුල් සහ ශක්ධේර් විසින් රචිත 'Practice and Procedure of Parliament' නම් ඉන්දියානු ප්‍රාමාණික කෘතියෙහි හය වැනි සංස්කරණයෙහි 705 වැනි පිටුවෙහි දැක්වෙන පරිදි, 'යෝජනාවකට සංශෝධනයක් පිළිගනු ලැබීමට නම්, එය පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ කළ යුතු වේ; යෝජිත සංශෝධනය යෝජනාවට අදාළ විය යුතු අතර එහි විෂය පථය තුළ පැවතිය යුතුය. එය අළුත් හෝ බාහිර කරුණු හඳුන්වාදීම හෝ යෝජනාවෙහි විෂය පථය පුළුල් කිරීම නොකළ යුතුය.' ඒ අනුව, අමාත්‍යවරයකුට එරෙහි විශ්වාසභංග යෝජනාවක් අමාත්‍ය මණ්ඩලයට එරෙහි විශ්වාසභංග යෝජනාවක් බවට පත් කිරීම අපේක්ෂා කරන සංශෝධනයක් සැබැවින්ම මුල් යෝජනාවෙහි විෂය පථය තුළ නොපවතින්නාක් මෙන්ම මුල් යෝජනාවට අදාළ ද නොවේ.

ස්ථාවර නියෝග 43 (5) හි මෙසේ සඳහන් වේ; 'පාර්ලිමේන්තුවේ රීති අනුව දැනුම්දීමකින් අනතුරුව ඉදිරිපත් කරනු ලබන පූර්ණ යෝජනාවකින් පමණක් මතු කරනු ලැබිය හැකි යම් ප්‍රශ්නයක් සංශෝධනයකින් මතු කරනු නොලැබිය යුත්තේ ය.'

අමාත්‍ය මණ්ඩලයට එරෙහි විශ්වාසභංග යෝජනාවක් ගෙන ඒමට හැකියාව ඇත්තේ නිසි දැනුම්දීමකින් අනතුරුව ඉදිරිපත් කෙරෙන පූර්ණ යෝජනාවකින් පමණක් බව අපි හොඳින් දන්නෙමු. අමාත්‍යවරයකුට එරෙහිව පවතින විශ්වාසභංග යෝජනාවකට ඒ වෙනුවෙන් වන සංශෝධනයක් ගෙන ඒම තුළින් මෙම ක්‍රියාවලිය උඩුයටිකුරු කිරීමට ගනු ලබන ප්‍රයත්නයක් රීත්‍යනුකූල නොවන සේම ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීමක් ද වේ.

ඉහත සඳහන් කරන ලද තත්ත්වයන් තුළ, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වෙත භාර දෙන ලද බලශක්ති අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මහතාට එරෙහි විශ්වාසභංග යෝජනාවට සංශෝධනය රීත්‍යනුකූල නොවන බවත් පිළිගත නොහැකි බවත් මම තීන්දු කරමි.''

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින් —

(i) 2019 වර්ෂය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2020 වර්ෂය සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව; සහ

(iii) 2020 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) වෙළඳ අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) විදුලිබල අමාත්‍යවරයා විසින් 2017 සහ 2018 වර්ෂ සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර එම වාර්තා, විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) විදුලිබල අමාත්‍යවරයා විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ විදුලිබල අමාත්‍යාංශයේ සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සම්බන්ධව සඳහන් කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කර එම වාර්තාව, මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 75 වගන්තිය යටතේ එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 මැයි 20 දිනැති අංක 2228/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා එම නියෝග, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) ජල සම්පාදන අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(12) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම**: රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා විසින් නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

මැදවච්චිය, අඟුනොච්චිය යන ලිපිනයෙහි පදිංචි එස්. බන්දුල සේනාරත්න මහතාගෙන් ලැබුණු 2020.09.15 දිනැති පෙත්සම ගරු දුමින්ද දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. මුදල්:** මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් විදේශ අමාත්‍යවරයා පිළිගැන්වූ පනත් කෙටුම්පත,— ඇතැම් නීති යටතේ හෙළිදරව් කිරීමට නියම කරන ලද හෙළිදරව් නොකළ බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳ ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීමට තැනැත්තන්ට ඉඩ ලබාදීම සඳහා ද; එසේ හෙළිදරව් කළ බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් සම්බන්ධයෙන් බද්දක් පැනවීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති නීති යටතේ විමර්ශනය කිරීමෙන්, නඩු පැවරීමෙන් සහ දණ්ඩනයන්ගෙන් වන බැඳීම සම්බන්ධයෙන් එකී යම් බදු අයකළ හැකි සැපයුම, ආදායම හෝ වත්කම ස්වේච්ඡාවෙන් හෙළිදරව් කරන තැනැත්තන් වගකීමෙන් මුක්ත කිරීම සඳහා ද; නිශ්චිතව දක්වා ඇති නීති යටතේ දැනටමත් බදු අයකළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳ හෙළිදරව් කර ඇති තැනැත්තන් වෙත ඇතැම් සහන ප්‍රදානය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ සහ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2021 අගෝස්තු 03 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද, එය මුද්‍රණය කළ යුතු යැයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමුකළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**6. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2021 අගෝස්තු 03 අඟහරුවාදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු පාඨලී චම්පික රණවක මහතා, ගරු ජේ. සී. අලවතුවල මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය:—

"අධිකරණයට අපහාස කිරීමට අදාළව දඬුවම් කිරීමේදී ඇතැම් අධිකරණවල බලතල නිර්වචනය කිරීම හා ඒ සම්බන්ධයෙන් එම අධිකරණවල ක්‍රියාපටිපාටි නියාමනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත අධිකරණ අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**9. බලශක්ති අමාත්‍ය, ගරු උදය ගම්මන්පිල මහතා කෙරෙහි විශ්වාස භංගත්වය:** විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2021 ජූලි 19) "ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ උත්තරදීමට බැඳී සිටින නමුත්, ආණ්ඩුව නියෝජනය කරන ප්‍රධානම පක්ෂය වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහලේකම්වරයා ලිඛිතව සඳහන් කර ඇති පරිදි අමාත්‍ය මණ්ඩලයේ

අනුමැතියකින් තොරව, බලශක්ති අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මහතා විසින් ඉන්ධන මිල ඉහළ දැමීමට කටයුතු කර ඇති හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27(1) ව්‍යවස්ථාවට අනනුකූල වන සේ, රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම උල්ලංඝනය කොට ඇති බැවින් ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 ව්‍යවස්ථාවට අනනුකූල වන සේ මූලික යුතුකම් පැහැර හැර ඇති බැවින් ද, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 53 ව්‍යවස්ථාව පරිදි ලබා දුන් ප්‍රතිඥාව කඩ කොට ඇති හෙයින් ද;

ලෝක වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ඉතා අධික ලෙස පහත වැටුණු 2020 ජනවාරි මස සිට මේ දක්වා පැවැති වසර එකහමාරකට ආසන්න කාලයක් තුළ මෙරට ඉන්ධන මිල අඩු නොකර ඉහළ මට්ටමක පවත්වා ගනිමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ රජය ලැබූ ලාභය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සහ ජනතාව දැනුවත් නොකළ හෙයින් ද;

එසේ ලෝක වෙළෙඳ පොළේ ඛනිජ තෙල් මිල අඩුවීමේ වාසිය ජනතාවට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල අඩු කරමින් ලබාදෙන බවට දුන් පොරොන්දුව ඉටු නොකළ හෙයින් ද;

එකී මිල වාසිය පදනම් කොටගෙන වසර දෙකක් තුළ ඉන්ධන මිල වැඩි නොකිරීමට දුන් පොරොන්දුව ඉටු නොකළ හෙයින් ද;

එකී මිල අඩුවීමේ වාසිය ඉන්ධන මිල ඉහළ යන විට දී භාවිතා කිරීමට රජය විසින් ස්ථාපනය කළ බවට ප්‍රකාශ කළ ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලට සිදුවූයේ කුමක්ද යන්න මෙම පාර්ලිමේන්තුවට සහ ජනතාවට දැන්වීමට අපොහොසත් වූ හෙයින් ද;

එකී මිල අඩුවීම තුළ රජය ලැබූ ලාභය උපයෝගී කොටගෙන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රාජ්‍ය බැංකුවලට ඇති ණයගැති බවින් මුදා ගැනීමට කටයුතු කිරීමට දුන් පොරොන්දුව ඉටු නොකළ හෙයින් ද;

ඒ අනුව, ඉන්ධන මිල ඉහළ යාම සහ ඒ හා සමගාමීව සියලුම පරිභෝජන භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය ඉහළ යාමත්, ඒ හා සමඟම උද්ධමනය ඉහළ යාමත් නිසා කොවිඩ් වසංගතය නිසා පීඩාවට පත්ව ඇති ජනතාව ආර්ථික වශයෙන් තවදුරටත් පීඩාවට පත් වන හෙයින් ද;

නිෂ්පාදන පිරිවැය ඉහළ යාම තුළින් අපනයනය කෙරෙහි සහ සමස්ත ආර්ථිකය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවිය හැකි හෙයින් ද;

රජය පත් වීමේදී ලබාදුන් ජනතා න්‍යාය පත්‍රය, රජයේ ප්‍රතිපත්තීන් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සෘජුව සහ අනියමින් උල්ලංඝනය කරමින් වරින් වර ලබා දුන් පොරොන්දු ඉටු කිරීමට අපොහොසත් ව ඇති හෙයින් ද;

බලශක්ති අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මහතාට තවදුරටත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.'' යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 90/2021]

(අ.භා. 1.48 ට නියෝජ්‍ය කාරක සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි වැවිලි අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.05 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

''ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි අධ්‍යාපන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.43 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.05ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 61; විරුද්ධව 152; යනුවෙන් බෙදී, එය නිශ්ප්‍රභ විය:—

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දෙසීය එකොළොස් දෙනෙක් (211) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. Maithreepala Sirisena | No |
| G 002. G.L. Peiris | No |
| G 003. Nimal Siripala de Silva | No |
| G 005. Johnston Fernando | No |
| G 006. Dinesh Gunawardana | No |
| G 007. Mahinda Rajapaksa | No |
| G 009. Basil Rajapaksa | No |
| G 010. Pavithradevi Wanniarachchi | No |
| G 011. Douglas Devananda | No |
| G 012. Gamini Lokuge | No |
| G 013. Dr. Bandula Gunawardana | No |
| G 014. Janaka Bandara Tennakoon | No |
| G 015. C.B. Ratnayake | No |
| G 016. Keheliya Rambukwella | No |
| G 017. Dullas Alahapperuma | No |
| G 018. Wimal Weerawansa | No |
| G 019. Mahinda Amaraweera | No |
| G 020. Vasudeva Nanayakkara | No |
| G 021. Ranjith Siyambalapitiya | No |
| G 022. S.M. Chandrasena | No |
| G 023. Mahindananda Aluthgamage | No |
| G 024. Udaya Gammanpila | No |
| G 025. Ramesh Pathirana | No |
| G 026. Prasanna Ranatunga | No |
| G 027. Namal Rajapaksa | No |
| G 028. Rohitha Abeygunawardana | No |
| G 029. Ali Sabry | No |
| G 030. Sarath Weerasekara | No |
| G 031. Susil Premajayanth | No |

| | |
|---|---|
| G 032. Piyankara Jayaratne | No |
| G 033. Duminda Dissanayake | No |
| G 034. Dayasiri Jayasekara | No |
| G 035. Lasantha Alagiyawanna | No |
| G 036. Dr. Sudarshini Fernandopulle | No |
| G 037. Arundika Fernando | No |
| G 038. Nimal Lanza | No |
| G 039. Wimalaweera Dissanayaka | No |
| G 040. Jayantha Samaraweera | No |
| G 041. Angajan Ramamathan | No |
| G 042. Dilum Amunugama | No |
| G 043. Mohan Priyadarshana | No |
| G 044. Vijitha Berugoda | No |
| G 045. Roshan Ranasinghe | No |
| G 046. Lohan Ratwatte | No |
| G 047. Janaka Wakkumbura | No |
| G 048. Vidura Wickramanayaka | No |
| G 049. Shehan Semasinghe | No |
| G 050. Kanaka Herath | No |
| G 051. Sanath Nishantha | No |
| G 052. Tharaka Balasuriya | No |
| G 053. Kanchana Wijesekara | No |
| G 054. Indika Anuruddha | No |
| G 055. Siripala Gamalath | No |
| G 056. Anuradha Jayaratne | No |
| G 057. S. Viyalanderan | No |
| G 058. Thenuka Vidanagamage | No |
| G 059. D.V. Chanaka | No |
| G 060. Sisira Jayakody | No |
| G 061. Piyal Nishantha De Silva | No |
| G 062. Prasanna Ranaweera | No |
| G 063. D.B. Herath | No |
| G 064. Nalaka Godahewa | No |
| G 065. Channa Jayasumana | No |
| G 066. Jeewan Thondaman | No |
| G 067. Shasheendra Rajapaksa | No |
| G 068. Seetha Arambepola | No |
| G 069. Ajith Nivard Cabraal | No |

| | |
|---|---|
| G 070. Mahinda Samarasinghe | No |
| G 071. S.B. Dissanayake | No |
| G 072. W.D.J. Senewiratne | No |
| G 073. Anura Priyadharshana Yapa | No |
| G 074. A.L.M.Athaullah | No |
| G 075. Tissa Vitharana | No |
| G 076. Dilan Perera | No |
| G 077. Jagath Pushpakumara | No |
| G 078. Jayarathna Herath | No |
| G 080. Chandima Weerakkody | No |
| G 081. Rohana Dissanayaka | No |
| G 082. Premalal Jayasekera | No |
| G 083. Shantha Bandara | No |
| G 084. Sarathie Dusmantha | No |
| G 085. K. Kadder Masthan | No |
| G 086. Asoka Priyantha | No |
| G 087. Mohamed Musammil | No |
| G 088. Tiran Alles | No |
| G 089. A. Aravindh Kumar | No |
| G 090. Amarakeerthi Athukorala | No |
| G 091. Kapila Athukorala | No |
| G 092. Sampath Athukorala | No |
| G 093. Thisakutti Arachchi | No |
| G 094. U.K. Sumith Udukumbura | No |
| G 095. Pradeep Undugoda | No |
| G 096. Sanjeewa Edirimanna | No |
| G 097. Akila Ellawala | No |
| G 098. Lalith Ellawala | No |
| G 099. Udayana Chaminda Kiringoda | No |
| G 100. Jagath Kumara | No |
| G 101. Geetha Kumarasinghe | No |
| G 102. K.P.S. Kumarasiri | No |
| G 103. Karunadasa Kodithuwakku | No |
| G 104. Nalaka Bandara Kottegoda | No |
| G 105. Upul Galappaththi | No |
| G 107. Kokila Gunawardene | No |
| G 108. S. Chadrakanthan | No |
| G 109. Milan Jayathilake | No |

| | |
|---|---|
| G 110. Kulasinghsm Thileepan | No |
| G 111. Pramitha Bandara Tennakoon | No |
| G 112. Shan Vijayalal de Silva | No |
| G 113. Chamara Sampath Dasanayake | No |
| G 114. Sudarshana Denipitiya | No |
| G 115. Isuru Dodangoda | No |
| G 116. Sagara Kariyawasam | No |
| O 002. Rajitha Senaratne | Yes |
| O 003. Imthiaz Bakeer Markar | Yes |
| O 004. Tissa Attanayake | Yes |
| O 005. Rauff Hakeem | Yes |
| O 006. Gayantha Karunatileka | Yes |
| O 007. Lakshman Kiriella | Yes |
| O 008. Sajith Premadasa | Yes |
| O 010. Patali Champika Ranawaka | Yes |
| O 011. Palany Thigambaram | Yes |
| O 012. Mano Ganesan | Yes |
| O 013. Ranil Wickramasinghe | Yes |
| O 015. A. Adaikkalanthan | Yes |
| O 016. Anura Dissanayake | Yes |
| O 017. G.G. Ponnambalam | Yes |
| O 018. A.A.S.M. Raheem | No |
| O 020. Athureliye Rathana Thero | No |
| O 021. Kabir Hashim | Yes |
| O 022. Thalatha Atukorala | Yes |
| O 023. Abdul Haleem | Yes |
| O 025. Sarath Fonseka | Yes |
| O 026. Harsha De Silva | Yes |
| O 028. R.M. Ranjith Madduma Bandara | Yes |
| O 029. Dilip Wedaarachchi | Yes |
| O 030. Niroshan Perera | Yes |
| O 031. Eran Wickramarathne | Yes |
| O 032. J.C. Alawathuwala | Yes |
| O 033. Govinthan Karunakaram | Yes |
| O 034. Dharmalingam Sithadthan | Yes |
| O 035. Vijitha Herath | Yes |
| O 036. Harini Amarasuriya | Yes |
| O 037. Selwarasa Gajenthiran | Yes |

| | |
|---|---|
| O 038. S. Noharathalingam | Yes |
| O 039. S. Shritharan | Yes |
| O 040. M.A. Sumanthiran | Yes |
| O 041. Vadivel Suresh | Yes |
| O 042. Ashok Abeysinghe | Yes |
| O 043. Ajith Mannapperuma | Yes |
| O 044. Buddhika Pathirana | Yes |
| O 045. Manusha Nanayakkara | Yes |
| O 046. Nalin Bandara Jayamaha | Yes |
| O 047. Hector Appuhamy | Yes |
| O 048. Thushara Indunil Amarasena | Yes |
| O 049. Velu Kumar | Yes |
| O 050. Kavinda Heshan Jayawardana | Yes |
| O 051. Mayantha Dissanayake | Yes |
| O 052. Sujith Sanjaya Perera | Yes |
| O 053. S.M. Marikkar | Yes |
| O 054. Imran Maharoof | Yes |
| O 055. Mujibur Rahuman | Yes |
| O 056. Harshana Rajakaruna | Yes |
| O 058. I. Charles Nirmalanathan | Yes |
| O 059. S. R. Rasamanikkam | Yes |
| O 060. Thavaraja Kalai Arasan | Yes |
| O 061. Rohini Kumari Wijerathne | Yes |
| O 062. Chaminda Wijesiri | Yes |
| O 063. Hesha Withanage | Yes |
| O 064. Waruna Liyanage | Yes |
| O 065. M. Udayakumar | Yes |
| O 066. W.H.M. Dharmasena | Yes |
| O 067. Kins Nelson | Yes |
| O 068. Rohana Bandara | Yes |
| O 078. Ishak Rahuman | No |
| O 080. Muszhaaraff Muthunabeen | No |
| O 081. Premanath C. Dolawaththa | No |
| O 082. H.Nandasena | No |
| O 083. Gayashan Nawananda | No |
| O 084. Asanka Nawaratne | No |
| O 085. Anupa Pasqual | No |
| O 086. Nimal Piyatissa | No |

| | |
|---|---|
| O 087. Muditha Prishanthi | No |
| O 088. Uddika Premaratne | No |
| O 089. Nalin Fernando | No |
| O 090. Sudath Manjula | No |
| O 091. Chinthaka Mayadunna | No |
| O 092. Wasantha Yapa Bandara | No |
| O 093. Nipuna Ranawaka | No |
| O 094. B.Y.G. Rathnasekara | No |
| O 095. Kumarasiri Ratnayaka | No |
| O 096. Ajith Rajapaksa | No |
| O 097. Gunathilaka Rajapaksa | No |
| O 098. Thilak Rajapaksa | No |
| O 099. Upul Mahendra Rajapaksa | No |
| O 100. M. Rameshwaran | No |
| O 101. Gamini Waleboda | No |
| O 102. Rajika Wickramasinghe | No |
| O 103. Sahan Pradeep Withana | No |
| O 104. Madura Withanage | No |
| O 105. D. Weerasinghe | No |
| O 106. Weerasumana Weerasinghe | No |
| O 107. Samanpriya Herath | No |
| O 108. Gevindu Cumaratunga | No |
| O 109. Yadamini Gunawardena | No |
| O 110. Manjula Dissanayake | No |
| O 111. Ranjith Bandara | No |
| O 112. Surendra Raghavan | No |
| O 113. Jayantha Weerasinghe | No |
| O 114. Charitha Herath | No |
| O 115. Marjan Falee | No |
| O 116. Diana Gamage | No |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව මහලේකම්වරයා විසින් පහත සඳහන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දෙදෙනෙකුගේ (02) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| R.Sampanthan | Yes |
| (Dr.) V. Radhakrishnan | Yes |

**10. කල් තැබීම:** එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබූයෙන් අ.භා. 5.55ට අද දින සභා සම්මතිය අනුව කථානායකවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අද දින සභා සම්මතිය අනුව 2021 අගෝස්තු 03 අඟහරුවාදා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.